Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2018/06/19 |
|---|---|---|

පැමිණිලිකාරිය : එම්.පී.කරුණාතිලක මිය,
නො : 712/9, දෙවන පටුමග,
කොළඹ 10.

වගඋත්තරකරු/වන් : විදුහල්පති,
ආනන්ද විද්‍යාලය,
කොළඹ 10.

පැමිණිලි අංක : **HRC/196/17**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ තමා නො : 712/9, දෙවන මරදාන, කොළඹ 10 ලිපිනයේ පදිංචි බවත්, එම ලිපිනයේ 2017 වසරේ කොළඹ ආනන්ද විද්‍යාලයේ පළමු ශ්‍රේණියට තම දරුවා ඇතුළත් කර ගැනීම සඳහා ආසන්නතා ගණය යටතේ අයදුම්පත් යොමු කර ඇති බවත්ය. එහිදී තමාට ලකුණු 85 ක් ලැබී තිබූ බවත් තාවකාලික ලැයිස්තුවේ තමාගේ නම 74 වන ස්ථානයේ තිබූ බවත් පසුව ස්ථිර ලේඛනයේ නම ඇතුළත් වී නොතිබූ බවත් සඳහන් කර ඇත. ඒ අනුව විද්‍යාලයට තම දරුවා ඇතුළත් කර ගැනීමට අවශ්‍ය සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ලබාදී තිබුනද දරුවා විද්‍යාලයට ඇතුළත් කර නොගැනීම තුළින් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බව පැමිණිල්ලෙන් ප්‍රකාශ කර ඇත. විද්‍යාලයට දරුවන් ඇතුළත් කර ඇති සීමාව 80.5 බවත් තමාට එම ලකුණු සීමාව ඉක්මවා ලකුණු ඇති බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

මේ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත්තේ. මෙම පැමිණිලිකාරිය CO 360 යටතේ අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලකුණු 85 ක්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14. ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන
ලේකම්
ක්ෂනික
වෙබ්

ලබා දී ඇති බවත්, මුල් අවස්ථාවේදී මෙම දරුවාගේ නම තාවකාලික ලේඛනයට ඇතුළත් කර තිබූ බව පිළිගන්නා බවත්ය. පසුව තාවකාලික ලේඛනයෙන් මොහුගේ නම ඉවත් කිරීමට හේතු වූයේ පදිංචි ස්ථානයේ හිමිකම සනාථ කිරීම සඳහා පැමිණිලිකාරිය විසින් ලේඛන කිසිවක් (උදා/ සින්නක්කර ඔප්පුව, බදු ඔප්පුව හෝ වෙනත් ලේඛනයක්) ඉදිරිපත් කර නොතිබූ බැවින් වන බවත් එම හේතුව සැළකිල්ලට ගෙන මැයගේ පදිංචිය සනාථ නොවන බව සලකා තාවකාලික ලේඛනයෙන් නම ඉවත් කර ඇති බව සඳහන් කර ඇත.

පැමිණිලිකාරියගේ පදිංචි ස්ථානයට ගොස් ස්ථානීය පරීක්ෂාවක් සිදුකළේ ද යන්න විමසා සිටීමේදී වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ ස්ථානීය පරීක්ෂාවේදි මෙම ස්ථානයේ පදිංචිව සිටින බව තහවුරු වී ඇති බවයි.

ඒ අනුව මෙම පැමිණිලිකාරිය විසින් පදිංචිය ඔප්පු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඡන්ද නාම ලේඛනය, ග්‍රාම නිලධාරි සහතික, පැමිණිලිකාරියගේ විවාහ සහතිකය, දරුවාගේ උප්පැන්න සහතිකය පැමිණිලිකාරියගේ සහ ස්වාමිපුරුෂයාගේ ජාතික හැඳුනුම්පත් දරුවාගේ සෞඛ්‍ය වර්ධන කාඩ්පත යන ලේඛනවල පැමිණිලිකාරිය අයදුම් කර ඇති ලිපිනය සඳහන් වන බවත්, එම සියලු ලේඛන අනුව පැමිණිලිකාරිය එම ස්ථානයේ පදිංචි බවට සාක්ෂි තිබෙන බව පැමිණිලිකාරිය පෙන්වා දී ඇත. ඒ අනුව පාසැල විසින් කරන ලද ස්ථානීය පරීක්ෂාවේදි ද පැමිණිලිකාරිය මෙම ස්ථානයේ පදිංචි බව තහවුරු වන්නේ නම් පැමිණිලිකාරියට පදිංචි ස්ථානයේ හිමිකාරීත්වය සනාථ කිරීමට ලේඛනයක් නොමැතිවීම මත පැමිණිලිකාරිය මෙම ස්ථානයේ පදිංචියේ නොමැති සේ සලකා පැමිණිලිකාරිය උපයාගෙන ඇති ලකුණු 85 ක ප්‍රමාණය නොසලකා හැරීමට හැකියාවක් තිබේද යන්න විමසා සිටීමේදී වගඋත්තර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ චක්‍රලේඛනයේ සඳහන් පරිදි පදිංචි ස්ථානයේ හිමිකම ඉදිරිපත් කළ යුතු ලේඛනයක් නොමැතිවීම මත ඇතුළත් කර ගැනීමට කටයුතු කර නොමැති බවයි.

නිරීක්ෂණ හා නිගමන :-

පැමිණිලිකාරියගේ දරුවා 2017 වසරේ කොළඹ ආනන්ද විද්‍යාලයේ 1 ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා ආසන්නතා ගණය යටතේ අයදුම්පත් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමෙන් පසුව ලකුණු 85 ක් ලබාදී ඇති අතර, තාවකාලික ලේඛනයට නම ඇතුළත් කර ඇත.

පැමිණිලිකාරිය පදිංචි ස්ථානයේ අයිතිය සනාථ කිරිම සඳහා ලේඛන නොමැතිවීම (සින්නක්කර ඔප්පුව, බදු ඔප්පුව) මත තාවකාලික ලේඛනයන් නම ඉවත් කර ඇති බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරු හෝ පැමිණිලිකරුගේ කලත්‍රයාගේ දෙමාපියන්ගේ නමින් ඔප්පුවක් හෝ බදු ඔප්පුවක් නොමැති බව විමර්ශනයේදී හෙළිවී ඇත.

පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයාගේ දෙමාපියන් මෙම නිවසේ දීර්ඝ කාලීනව පදිංචිව සිටින බවත්, පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයා වන ඩබ්.ඒ.චමින්ද පෙරේරා එම නිවසේ උපන්දා සිට පදිංචිව සිටින බවත් පැමිණිලිකාරිය විවාහවීමෙන් පසුව ඔහු එම නිවසේ ජීවත් වන බවත්, පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයාගේ මව වන හේවගේ සුමනාවතී දිවුරුම් ප්‍රකාශයක් ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

ඉහත කරුණු අනුව පැමිණිලිකාරිය පදිංචි ස්ථානයේ අයිතිය සනාථ කිරීමට ලේඛන නොමැතිවීම මත ඔප්පුවට හිමිවිය යුතු ලකුණු ප්‍රමාණය ලබාදිය නොහැකි වුවද අනෙකුත් නිර්ණායක අනුව හිමිවන ලකුණු ප්‍රමාණය කඩඉම් ලකුණු ඉක්මවන්නේ නම් හා පදිංචිය තහවුරු වන්නේ නම් විද්‍යාලයට ඇතුලත් කිරීම චක්‍රලේඛ උල්ලංඝනය වීමක් නොවන බව නිරීක්‍ෂණය වේ.

මෙහිදී පැමිණිලිකාරිය ඉදිරිපත් කර ඇති ලේඛන පරීක්ෂා කර ලකුණු 85 ක් ලබා දී ඇති අතර. වගඋත්තරකරුවන් එම ලකුණු ප්‍රමාණය ඇය වෙත හිමිවිය යුතු ලකුණු ප්‍රමාණය බවට පිළිගෙන ඇත.

එමෙන්ම ප්‍රායෝගිකව ස්ථානීය පරීක්ෂාවක් වගඋත්තරකරුවන් විසින් සිදුකර ඇති අතර එහිදී එම ස්ථානයේ පැමිණිලිකරුවන් පදිංචි බවට වගඋත්තරකරුවන් තහවුරු කරගෙන ඇත. විද්‍යාලයට ළමුන් ඇතුළත් කර ඇති කඩඉම් ලකුණු සීමාව 80.5 වන අතර පැමිණිලිකාරිය ලබාගෙන ඇති ලකුණු සංඛ්‍යාව ලකුණු 85 ක් වන බවද නිරීක්ෂණය වේ.

ඉඩමෙහි අයිතිය නොතිබීම විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට තීරණාත්මක සාධකයක් ලෙස වගඋත්තරකරුවන් මෙහිදී සලකා තිබුනද චක්‍රලේඛන අනුව හා රජයේ ප්‍රතිපත්තිය අනුව පාසලක් හිමිවිය යුත්තේ ආසන්න පදිංචිය තහවුරු කිරීම මත වේ. මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය විසින් ස්ථානයේ පදිංචිය ලේඛන අනුව තහවුරු කර ඇති අතර. ස්ථානීය පරීක්ෂාවන් මගින්ද ඒ බව සනාථ වී ඇත. පදිංචි ඉඩමේ අයිතිය ඔවුන්ට නොමැති වුවද ඉහත කාරණා සපුරන්නේ නම් දරුවාට පාසලක් ලබාදීමට චක්‍රලේඛනයන් බාධාවක් ඇති බව නිරීක්‍ෂණය නොවේ.

ඉහත නිරීක්ෂණ අනුව පැමිණිලිකාරිය කඩඉම් ලකුණු සීමාව ඉක්මවා ලකුණු ලබා තිබීම හා ස්ථානීය පරීක්ෂණයෙන් පැමිණිලිකාරිය අදාළ ස්ථානයේ පදිංචි බවට තහවුරු වී තිබීම මත පැමිණිලිකාරියගේ දරුවා විද්‍යාලයට ඇතුළත් කිරීමට සුදුසුකම් ලබාගෙන තිබියදීත් ඇතුළත් නොකිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව පැමිණිලිකාරියගේ දරුවා සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකාරියගේ දරුවා වන ඩබ්ලිව්.ඒ. ඉදුෂ ගිම්හාන් දරුවා කොළඹ ආනන්ද විද්‍යාලයේ 2017 වර්ෂයේ 01 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

2018.07.19 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 01 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/